# "ආයති" - විශේෂ අවශ්‍යතා සහිත ළමුන් සඳහා වූ විශිෂ්ඨතා මධ්‍යස්ථානය

***රාගම පිහිටි කැලණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේ ඉදි කිරීමට නියමිත ප්‍රථම ජාතික විශිෂ්ඨතා මධ්‍යස්ථානය වේ .***

ශ්‍රී ලංකාවේ ආබාධිත, විශේෂ අවශ්‍යතා හා ඉගෙනුම් අබාධ සහිත දරුවන්ගේ ජීවන තත්වය නංවාලමින් ඔවුන්ට ස්වාධීනව ජීවත් වීම සඳහා හේමාස් හෝල්ඩින්ග්ස් තම සමාජ සත්කාරක සේවාවන්හි නවතම ව්‍යාපෘතියක් ලෙස, කැලණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේ මුලිකත්වයෙන් " ආයති" විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ විශිෂ්ඨතා මධ්‍යස්ථානය දියත් කිරීමේ පළමු පියවර ප්‍රකාශයට පත් කරන ලදී. "ආයති" යනු සංස්කෘත භාෂාවෙන් ගත් කළ "බලාපොරොත්තුව" යන්න අර්ථකථනය කරයි.

මෙම "ආයති" මධ්‍යස්ථානය තුළින් විශේෂ අවශ්‍යතා සහිත ළමුන් හට ඔවුන්ගේ උපරිම හැකියාවන් මුදුන්පත් කර ගනිමින් සමාජයට රැගෙන ඒම සඳහා බලාපොරොත්තු හා අවස්ථාවන් ලබා දෙයි. මෙම මුලපිරීම තුළින් දැනට රටේ දැවෙන ජාතික ප්‍රශ්නයක්ව පවතින විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හට බහු කාර්ය වෘත්තිකයන් ගේ රැකවරණය යටතේ වූ මධ්‍යස්ථානයක් ලබා දීම සිදු කරනු ලබයි.

මෙම මධ්‍යස්ථානය පිහිටුවනු ලබන්නේ රාගම පිහිටි කැළණි විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේය. එය ආසියානු කලාපය තුළ බහු කාර්ය වෘත්තිකයන් ගෙන් සමන්විත අබාධිත ළමුන් සඳහා වූ අධ්‍යයන අංශයක් ඇති එකම වෛද්‍ය පීඨය වේ. ගමනාගමන පහසුව සඳහා මෙම පීඨ පරිශ්‍රය ආසන්නයේම දුම්රිය හා බස් නැවතුම්පොළ ද පිහිටා ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රශ්නයක් වූ මෙහි වර්තමාන තත්වය ගැන වෛද්‍ය පීඨයේ පීඨාධිපතිනි මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය අදහස් ප්‍රකාශ කරමින් පවසා සිටියේ " අද වන විට විවිධ වූ අබාධිත තත්වයන් ලොවපුරා ඉහළ ගොස් තිබෙනවා. මම ඉතාමත් සතුටට පත් වෙනවා අප රටේ ජාතික අවශ්‍යතාවයක්ව පවතින විශේෂ අවශ්‍යතා සහිත දරුවන් හට ඔවුන්ගේ සුවිශේෂී හැකියාවන් නගා සිටුවීම සඳහා අප හට මෙවන් ව්‍යාපෘතියක් දියත් කිරීමට ලැබීම ගැන. වර්තමානයේ මෙවන් දරුවන් 1500 ක් පමණ ලියාපදිංචිව ඇති අවම පහසුකම් සහිත කුඩා සායනයක් අප පවත්වාගෙන යනවා. අප මෙම මධ්‍යස්ථානය ඉදිකිරීම තුළින් විශාල ප්‍රජාවක් හට

ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගනිමින් ඒ සඳහා මූලික ප්‍රතිකාර කරමින් වෘත්තීය පුහුණුව හා ජීවන කුසලතා ඔප නැංවීම සඳහා කටයුතු කරනවා. එමෙන්ම මෙම මධ්‍යස්ථානය නිසා වෛද්‍ය හමුවීම් , කථන හා භාෂා ප්‍රතිකාර, ශ්‍රවණ ප්‍රතිකාර හා වෘත්තීමය චිකිත්සා මෙන්ම භෞත චිකිත්සක ප්‍රතිකාර ක්‍රමද එකම ස්ථානයකින් ලබා ගත හැකි වෙනවා.

මහාචාර්ය නිලන්ති ද සිල්වා මහත්මිය තවදුරටත් අදහස් ප්‍රකාශ කරමින් "නිසියාකාර පුහුණු හා වැඩිදුර පරීක්ෂණ කටයුතු සඳහා පහසුකම් ලැබීම අපගේ වාසනාවක්ය කියා මා විශ්වාස කරනවා. එමෙන්ම මෙය  බොහෝ උපාධි අපේක්ෂකයන්ට, විශ්වවිද්‍යාලයට නිරන්තරයෙන් පැමිණෙන විදේශීය උපාධිධාරීන්ට වගේම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ දෙමාපියන්ට මෙන්ම එම දරුවන්ටද අනිවාර්යයෙන්ම ඉතා හොඳ අත්දැකීමක් වනවාට කිසිදු සැකයක් නැහැ. මෙහි විශේෂත්වය වන්නේ මෙය විශේෂ අවශ්‍යතා සහිත ළමුන්හට වූ ප්‍රථම ජාතික විශිෂ්ඨතා මධ්‍යස්ථානය වීමයි.

විශේෂ අවශ්‍යතා සහිත ළමුන් හට ඔවුන්ට ආවේණික හැකියාවන් හඳුනා ගැනීමට මෙන්ම "ආයති" හි බලාපොරොත්තුව ඔවුන්ගේ දෙමාපියන්ට අවශ්‍ය පුහුණුවත්, සේවාදායකයන්ට එනම්, පවුල් සෞඛ්‍ය සේවිකාවන්ට, පෙර පාසැල් ගුරුවරියන්ට මේ සම්බන්ධ පුහුණු ලබා දීමටයි. තවද ඉදිරියේදී මෙම මධ්‍යස්ථානය  එම දෙමාපියන්ගේ පහසුව පිණිස වැඩිදුර ප්‍රතිකාර හා උපදේශන ලබා ගැනීම සඳහා දිවයිනේ අනෙකුත් පිළිගත් ආයතන සමග අනුබද්ධව කටයුතු කරනු ඇත.

දිවයිනේ සුප්‍රසිද්ධ ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන චන්න දාස්වත්ත මහතා විසින් "ආයති" මධ්‍යස්ථානයේ සැලසුම නිර්මාණය කරන අතර එය රාගම පිහිටි අක්කර 1 1/2 ක භූමි ප්‍රමාණයක වර්ග අඩි 42000 කින් යුත් ගොඩනැගිල්ලක් වනු ඇත. ඒ සඳහා ආසන්න වශයෙන් රුපියල් මිලියන 350ක් පමණ වෙතැයි ඇස්තමේන්තු  කර තිබේ . මෙම මධ්‍යස්ථානය දිවයිනේ දිස්ත්‍රික්ක 25 ටම කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කිරීමට නියමිත අතර මූලික අදියරේදී  අඩු සම්පත්  සහිත ප්‍රදේශයන් හට විදුලි සංදේශන තාක්ෂණය මගින් දුරස්ථ උපදේශන සේවාවන් ලබා දීමට බලාපොරොත්තු වෙයි.

"අප මෙම අයාති ව්‍යාපෘතිය දියත් කිරීමට සිතුවේ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා එක්ව 2002 වසරේ දී ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධනය අරමුණු කරගනිමින් දියත්කළ අපගේ ප්‍රථම ආයතනික සමාජ සත්කාරක ව්‍යාපෘතිය වන "පියවර"  ව්‍යාපෘතිය ලද සාර්ථකත්වය නිසයි. පියවර අද වන විට පෙර පාසල් 41ක් දක්වා ව්‍යාප්තවූ ජාතික ව්‍යාපෘතියක් බවට පත් වී තිබෙනවා. දීපව්‍යාප්ත මෙම පෙර පාසල්හි අද වන විට ගුරුවරියන් 100 කට වැඩි ප්‍රමාණයක් ඉගැන්වීමේ

කටයුතු වල නිරත වන අතර ළමුන් 3500 ක් පමණ ඉගෙනුම ලබනවා. එය, වසර ගණනාවක් පුරා පැවති ශ්‍රී ලංකාවේ රාජ්‍ය පෞද්ගලික අංශයන් එකට එක්ව පවත්වාගෙන යන සාර්ථකම ව්‍යාපෘතියක් බවට පත්වී තිබෙනවා. ශ්‍රී ලංකාවේ දැවෙන ප්‍රශ්නයක් වන මෙවන් අබාධිත දරුවන් වෙනුවෙන් ව්‍යාපෘතියක් දියත් කිරීමට අප පෙළඹුනේ අපගේ මෙම රාජ්‍ය - පෞද්ගලික සබඳතාවය තුලින් ගොඩනගා ගත් විශ්වාසය හා පැහැදීම නිසා." යැයි හේමාස් හෝල්ඩින්ග්ස් සමූහයේ අධ්‍යක්ෂක හා හේමාස් අවුට්රීච් පදනමේ සභාපති වන අබ්බාස් යුසුෆාලි මහතා මේ සම්බන්ධව ප්‍රකාශ කර සිටියේය.

"ආයති" මධ්‍යස්ථානය කැලණිය විශ්වවිද්‍යාල වෛද්‍ය පීඨයේ පීඨාධිපතිනියගේ ප්‍රධානත්වයෙන් යුත් කීර්තිමත් භාරකාරත්ව මණ්ඩලයක් මගින් කළමනාකරණය කරනු ලබයි. මෙහි අරමුදල් කළමනාකරණය කිරීම සඳහා ස්වාධීන ගණකාධිකරණ සමාගමක් පත් කිරීමට බලාපොරොත්තු වන අතර විගණකවරුන් ලෙස කටයුතු කරන්නේ E&Y සමාගමයි.

අපගේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ අනෙක් දරුවන්ට මෙන් අබාධිත දරුවන් සඳහාද සමාන අධ්‍යාපනය, සෞඛ්‍ය, සමාජ සහභාගීත්වය හා රැකියා අවස්ථා ලබා දීමයි. යෝජිත"ආයති" මධ්‍යස්ථානය සඳහා සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් හේමාස් සමූහය විසින් යොදනවා. ඒ සමගම අපි අනෙකුත් සියලුම සමාගම්, ව්‍යාපාර හවුල් කරුවන් හා මේ සඳහා සහය දැක්වීමට කැමති ඕනෑම පුද්ගලයෙකු හට අප ආරාධනා කර සිටිනවා මෙම ජාතික අවශ්‍යතාවයට සම්බන්ධ වීමෙන් මෙහි හවුල්කරුවෙකු වීමට." යැයි හේමාස් හෝල්ඩින්ග්ස් සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී ස්ටීවන් එන්ඩර්බි මහතා අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේය.

මෙම ව්‍යාපෘතියේ භාරකාර මණ්ඩල සාමාජිකයන් ලෙස ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ඉතිහාසයේ පුරෝගාමීන් වන රොෂාන් මහානාම හා කුමාර් සංගක්කාර යන ලෝක පූජිත ක්‍රිකට් ක්‍රීඩකයන් දෙපළ මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් තම උපරිම දායකත්වය දක්වමින් හා අබාධිත දරුවන් වෙනුවෙන් පෙනී සිටිමින් අයාති මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

..............................................

**මාධ්‍ය සම්බන්ධීකරණය**

ශිරෝමි මාසකෝරාළ
විධායක අධ්‍යක්ෂිකා - හේමාස් අවුට්රීච් පදනම

හේමාස් සමූහ ප්‍රධානී - තිරසාරත්ව හා සමූහ සන්නිවේදන

දුරකථන ඃ 4731741 ජංගම දුරකථන ඃ 0773020028